රු අමාත්‍යතුමා
களரவ அமைச்சர்
Hon. Minister
011-2435248
Fax : 011-2390885

ලේකම්
செயலாளர்
Secretary
011-2436123
011-2436124
Fax : 011-2449402

අමාත්‍යාංශය
அமைச்சு
Ministry
011-2392149
011-2392150
Fax : 011-2390941

විද්‍යුත් තැපැල
மின்னஞ்சல்
E-mail
secretarymid@gmail.com

# කර්මාන්ත අමාත්‍යාංශය
# கைத்தொழில் அமைச்சு
# MINISTRY OF INDUSTRIES

තැ. පෙ. 570, 73/1, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව த. பெ. இல. 570, 73 / 1, காலி வீதி, கொழும்பு 03, இலங்கை
P. O. Box 570, 73/1, Galle Road, Colombo 03, Sri Lanka

මගේ අංකය
எனது இல.
My No.
MIC/ADM/08/17/01(iv)

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2022.06.17

තරිඳු ජයවර්ධන මහතා,
නො.176/3,
ඔරුතොට,
ගම්පහ.

**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2022.03.18 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රය අනුව ඉල්ලා ඇති තොරතුරු මේ සමඟ එවන බව කාරුණිකව දන්වමි.

එන්.ජී. පණ්ඩිතරත්න
තොරතුරුනිලධාරි
අතිරේක ලේකම්(පාලන)

මාගේ අංකය : MI/RST/06/06

ප්‍රතිව්‍යුහගතකරණ අංශය
කර්මාන්ත අමාත්‍යාංශය

2022.06.07

අතිරේක ලේකම් (පාලන)

**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් එවා ඇති MIC/PAF/02/18 හා 2022.05.17 දිනැති ලිපිය හා බැඳේ.

02. අංක 176/3, ඔරුතොර, ගම්පහ පදිංචි තරිඳු ජයවර්ධන මහතා විසින් උක්ත පනතේ විධිවිධාන අනුව ඉල්ලුම් කර ඇති තොරතුරු පහත සඳහන් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

| අංකය | ඉල්ලා සිටින තොරතුර | විස්තරය |
|---|---|---|
| 01 | යූරියා පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට අදාලව 2020/12/21 දිනැතිව අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවේ සහතික පිටපත | ඇමුණුම 01හි ඇතුලත් කර ඇත. |
| 02 | එම ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමට බාරදුන් ආයතනය | Sri Lanka Institute of Nano Technology (Pvt) Ltd ( SLINTEC) |
| 03 | එම ආයතනයට බාරදීමට අදාල ලිපියේ සහතික පිටපත | ඇමුණුම 02 හා ඇමුණුම 03 හි ඇතුලත් කර ඇත |
| 04 | එම ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමට එම ආයතනය තොරාගත් ක්‍රමවේදයට අදාල ලේඛණවල සහතික පිටපත් | අංක 20/2043/320/035 හා 2020.12.21 දිනැතිව මෙම ශක්‍යතා අධ්‍යයනය SLINTEC ආයතනය මගින් සිදු කිරීමට තීරණය කර ඇත. (ඇමුණුම 04) |
| 05 | එම ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ සහතික පිටපත | සෞභාග්‍යයේ දැක්ම රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ හඳුන්වා දී ඇති කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීමේ තීරණය මත, මෙම ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම ප්‍රමාද කිරීමට කටයුතු කරන ලෙස මුදල් අමාත්‍යාංශය මගින දැනුම්දීමක් කර ඇත. එබැවින් මෙම ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමේ කටයුතු මෙතෙක් ආරම්භ කර නැත. යූරියා පොහොරක් වශයෙන් මෙන්ම වෙනත් ක්ෂේත්‍ර ගණනාවක භාවිතයට ගන්නා බැවින් මෙම ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම වැදගත් බවත් ඒ සඳහා එකඟතාවය ලබා දෙන ලෙස ඉල්ලීමක් මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත ලිපියක් මගින් යොමු කර ඇත. |

A. U. Weerasinghe

ඩබ්ලිව් පී.ඒ.යූ. වීරසිංහ
අධ්‍යක්ෂ (ප්‍රතිව්‍යුහගතකරණ)

ඇමුණුම 01


...මාත්‍යතුමා / ...ෂ அமைச்சர் / Minister } 011-2435248 Fax : 011-2390885

...ල්කම් / ...யலாளர் / Secretary } 011-2436123 011-2436124 Fax : 011-2449402

අමාත්‍යාංශය / அமைச்சு / Ministry } 011-2392149 011-2392150 Fax : 011-2390941

විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail } secretarymid@gmail.com


# කර්මාන්ත අමාත්‍යාංශය
# கைத்தொழில் அமைச்சு
# MINISTRY OF INDUSTRIES


තැ. පෙ. 570, 73/1, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව த. பெ. இல. 570, 73 / 1, காலி வீதி, கொழும்பு 03, இலங்கை
P. O. Box 570, 73/1, Galle Road, Colombo 03, Sri Lanka


...අංකය / ...இல / ... 2020/61 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020.12.16

## අමාත්‍ය මණ්ඩල සංදේශය

## යූරියා පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් සිදු කිරීමට අදාලව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම

### 1.0. පසුබිම

1.1 ශ්‍රී ලංකාවේ වාර්ෂික යූරියා පොහොර අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 340,000 ක් පමණ වන අතර, දැනට එම සමස්ත ප්‍රමාණයම විදේශ රට වලින් ආනයනය කරනු ලබයි. 2019 වර්ෂයේදී යූරියා පොහොර ආනයනය කිරීම වෙනුවෙන් වැයකර ඇති මුදල රුපියල් බිලියන 26 කි.

1.2 සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම (Paranthan Chemicals Company Limited) ආයතනය කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පූර්ණ රජය සතු සමාගමක් වශයෙන් ක්‍රියාත්මක වන අතර, එම සමාගම විසින් ශ්‍රී ලංකාවේ පානීය ජල සුරක්ෂිතතාවට අවශ්‍ය දියර ක්ලෝරීන් (Chlorine) ආනයනය කර ජල සම්පාදන සහ ජලපවාහන මණ්ඩලයට බෙදා හැරීම සහ හයිඩ්‍රොක්ලෝරික් අම්ලය (HCL) සහ සෝඩියම්හයිපොක්ලෝරයිට් රසායන ද්‍රව්‍ය නිෂ්පාදනයෙහි නිරතව සිටියි.

1.3 ශ්‍රී ලංකාව තුළ යූරියා නිෂ්පාදනය සිදු කිරීම තුළින් එය ආනයනය කිරීම සඳහා වැය කරනු ලබන මුදල අවම කරගැනීමට ඇති හැකියාව පිළිබඳව සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම විසින් අවධානය යොමු කර ඇත. ඒ අනුව යූරියා පොහොර නිෂ්පාදනය සිදු කිරීමට අදාලව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් සකස් කර ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර, එම අධ්‍යයනය වෙනුවෙන් රු.මි. 38.2 ක මුදලක් ලබා දෙන ලෙස මෙම අමාත්‍යාංශය හරහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය අවසානයේදී එම වර්ෂය සඳහා අනුමත කරන ලද අයවැය වැඩසටහන යටතේ රු.මි.38.2 ක මුදලක් ඉහත ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම සඳහා ලබා දී ඇත.

### 2.0 සාධාරණීකරණය

2.1 යෝජිත ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම සඳහා සුදුසු උපදේශන ආයතනයක් තෝරා ගැනීමේ ක්‍රියාවලිය රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් සිදු කළ යුතු වන අතර, ඒ සඳහා අවම වශයෙන් මාස හතරක පමණ කාලයක් ගත වේ. ශක්‍යතා අධ්‍යයනයේ සියළු කටයුතු සම්පූර්ණ කිරීම සඳහා අවම වශයෙන් වසරක පමණ කාලයක් අවශ්‍ය වේ. මෙම ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම සඳහා මුදල් ලබා දී ඇත්තේ 2020 වර්ෂයට අදාල අයවැය වැඩසටහන යටතේ වන බැවින් ඊට අදාල කටයුතු 2020.12.31 වන දිනට සිදු කර අවසන් කළ යුතු වේ. එසේ වුවත් ඉහත සඳහන්

කර ඇති පරිදි නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් කටයුතු කිරීමේදී ශක්‍යතා අධ්‍යයනයේ කටයුතු 2020.12.31 වන දිනට අවසන් කිරීම ප්‍රායෝගිකව සිදු කළ නොහැක.

2.2 ඉහත (2.1) හි සඳහන් හේතුව මත මෙම ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම වෙනුවෙන් රජයට අනුබද්ධ ආයතන වන කර්මාන්ත සේවා කාර්යාංශය (Industrial Services Bureau - ISB වයඹ පළාත් සභාව) සහ මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය (Central Engineering Consultancy Bureau - CECB) යන ආයතන දෙක වෙතින් යෝජනා ලබා ගෙන මෙම අමාත්‍යාංශය මගින් පත් කරන ලද ඇගයීම් කමිටුවක් වෙතින් ඇගයීම සිදු කර මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය (CECB) ඉහත සඳහන් ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම සඳහා තෝරා ගෙන ඇත. (ඇමුණුම 01)

2.3 මෙම ව්‍යාපෘතිය 2020 අයවැය වැඩසටහන යටතේ දැනටමත් මුදල් වෙන් වී ඇති ව්‍යාපෘතියක් බැවින් ද තෝරා ගෙන ඇති ආයතනය රජයට අනුබද්ධ ආයතනයක් වන බැවින් ද මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය (CECB) අදාල ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමේ කටයුතු පැවරීම සුදුසු බව යෝජනා කරමි.

## 3.0 නිර්දේශ

ඉහත සඳහන් කරුණු අනුව යූරියා පොහොර නිෂ්පාදනය කිරීම සඳහා වන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය පහත සඳහන් කොන්දේසි වලට යටත්ව සිදු කිරීමට පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් ආයතනය විසින් තෝරා ගෙන ඇති මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය (CECB) වෙත භාරදීම සුදුසු බව නිර්දේශ කරමි.

3.1 නියමිත කාලය තුළ ශක්‍යතා අධ්‍යයනය සිදු කර අවසන් කිරීමට යටත්ව ඒ සඳහා වැය වන රුපියල් තුන්සිය පනස් තුන් ලක්ෂ පනස් තුන් දහසක (රු:35,353,000.00) මුදල මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය (CECB) වෙත ගෙවීම් කිරීම සඳහා 2020 අයවැය වැඩසටහන යටතේ ලබා දී ඇති ප්‍රතිපාදන මගින් එකවර (Up Front Payment ) සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම වෙත ගෙවීම් කිරීම.

3.2 යථෝක්ත ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම සම්බන්ධයෙන් කොන්දේසි ඇතුළත් ගිවිසුමක් සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම සහ මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය (CECB) අතර අත්සන් කිරීම.

3.3 අත්සන් කරනු ලබන ගිවිසුමේ කොන්දේසිවලට යටත්ව ශක්‍යතා අධ්‍යයනය ඉදිරි මාස අටක (08) ක කාලය තුළ සිදු කර අවසන් කිරීම හා ඊට අදාලව ගතයුතු සියළුම ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම වෙත පැවරීම .

## 4.0 අනුමැතිය

ඉහත 3.1 සිට 3.3 දක්වාවූ නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කරමි.

විමල් වීරවංශ (පා.ම.)
කර්මාන්ත අමාත්‍ය

## Minutes of the CPCM MEETING
## EVALUATION OF PROPOSALS

| | | | | |
|---|---|---|---|---|
| Nature of the Procurement Committee | Ministry Consultants Procurement Committee(CPCM) | Name of the Procurement Entity | Paranthan Chemicals Company Limited ( PCCL ) | |
| Title of Procurement | Selection of Consultancy Firm for Feasibility study of Urea Fertilizer Manufacturing Project | | | |
| Meeting No. | 01 | 16th December 2020 | Purpose/s | Evaluation of Proposals |
| Present | | | | |
| Members of CPCM | | | | |
| CPCM Members | | | | |
| Mr.K.G.R.Wimalasooriya | Additional Secretary (State Enterprises & Restructuring), Ministry of Industries | Committee Chairman | | |
| Mr. UpulRanaweera | Chairman-PCCL | Committee Member | | |
| Mr. G.A.J. Wijesundara | General Manager-PCCL | Committee Member | | |
| Mr. Tissa Liyanage | DGM (Eng)-PCCL | Committee Member | | |
| Mr. MalithSasanka | Procurement Specialist (Independent Consultant) | Committee Member | | |

**MAIN OBSERVATIONS**

1. The Treasury has allocated Rs.38.2 million from the year 2020 budget to conduct a Feasibility Study of Urea Fertilizer Manufacturing Project to Paranthan Chemicals Company Limited.
2. As per the directive received from the Treasury, the entire process is to be completed before 31st December 2020, if not allocated money has to be returned to the Treasury.
3. Meeting conducted by the Secretary to the Ministry of Industries on 9th Dec.2020 and directed to the Chairman PCCL to expedite the process due to time constrain and obtain direct proposals from Central Engineering Consultancy Bureau and Industrial Services Bureau.
4. The Request For Proposals ( RFP ) was sent to three Government Consultancy firms as directed by the Secretary to the Ministry as follows:
   1). Central Engineering Consultancy Bureau ( CECB )
   2). Industrial Services Bureau ( ISB )
   3). University of Moratuwa (This was proposed by Board Members of PCCL)
5. Two Proposals were received on 15th December 2020.
6. PCCL received two proposals as per the RFP and the evaluation was carried out covering the following key areas.
   - Approach and Methodology -300 marks
   - Personnel ( Area of Expertise) - 700 marks
7. Both firms were obtained qualified marks and Central Engineering Consultancy Bureau is the highest rank consultancy firm out of two firms submitted proposals.

**Main Decisions Taken**

Technical Evaluation Committee recommends to award the contract to Central Engineering Consultancy Bureau for the sum of Rs. 35,353,000.00 Excluding VAT to conduct this Feasibility Study of Urea Fertilizer Manufacturing Project as per the Terms of Reference given by the Paranthan Chemicals Company Limited.

**Signatures:**

| Name | Capacity | Agreed with the above Decision/s (Yes/No) | Signature |
|---|---|---|---|
| Mr.K.G.R. WIMALASOORIYA | Committee Chairman | Yes | [signature] |
| MR. UPUL RANAWEERA | Committee Member | Yes | [signature] |
| MR. TISSA LIYANGE | Committee Member | Yes | [signature] |
| MR. G.A.J.WIJESUNDARA | Committee Member | Yes | [signature] |
| MR. MALITH SASANKA | Committee Member | Yes. | [signature] |

ඇමුණුම (02)

# පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
# பரந்தன் கெமிக்கல்ஸ் கம்பனி லிமிட்டட்
# PARANTHAN CHEMICALS COMPANY LIMITED

## කර්මාන්ත අමාත්‍යාංශය
## கைத்தொழில் அமைச்சு
## MINISTRY OF INDUSTRIES


Chairman
Tel. No. +94112437830
Fax +94112437831

General Manager
Tel. No. / Fax +94112437556

E-Mail chairman@pccl.gov.lk
gm@pccl.gov.lk
info@pccl.gov.lk

Web: www.pccl.gov.lk


My Number PCC/CH/2021/76 Your Number ........................ Date 19.04.2021

The Chairman,

Sri Lanka Institute of NanoTechnology (pvt)ltd,

Nanotechnology and Science Park,

Pitipana,

Homagama.

**Consultancy Services for Feasibility Study of Urea Fertilizer Manufacturing Project-**

**Contract No.PCCL/UFP/FS/2020/01**

References: - A- Cabinet Paper No.20/2043/320/035 dated 16th December 2020.

B - Your Proposal Dated 26th March 2021.

We are pleased to inform you that your Proposal is accepted by M/S Paranthan Chemicals Company Limited as directive given by the cabinet.

2. Total cost of Feasibility Study will be Rs.35,353,000.00, above amount allocated for the entire Feasibility Study. No additional amount will be allocated.

3. Feasibility Study shall be conducted as per above Terms of Reference and deliverables should be submitted to as per the deliverable scheduled as an annex A to this letter.

4. Finalized agreement by the Attorney General's Department shall be signed within 07 days of accepting this letter.

5. Please acknowledge acceptance of this award in writing within 07days of receipt of this letter.

Yours faithfully,

Upul Ranaweera
Chairman
Chartered Engineer
Bsc(Eng) Hons,CEng,MIE(SL)
Paranthan Chemicals Company Limited

Upul Ranaweera

Chairman

Paranthan Chemicals Company Limited

[illegible]

A.N. Weerasinghe

1) Annex -A -Deliverable Schedule

ඒ.එන්. වීරසිංහ

**SLINTEC**
SRI LANKA INSTITUTE OF NANOTECHNOLOGY (PVT) LTD.

20th April, 2021

Mr. Upul Ranaweera,

Chairman

Paranthan Chemicals Company Limited,

Ministry of Industries,

100/25, Sri Ramanathan Mawatha,

Colombo 13.

Dear Sir,

**Consultancy Services for Feasibility Study of Urea Fertilizer Manufacturing Project**

**Contract No: PCCL/UFP/FS/2020/01**

With reference to your letter (Reference No: PCC/CH/2021/76) dated 19th April, 2021 with Annex A, Cabinet Paper No:20/2043/320/035 dated 16th December 2020 and proposal submitted by Sri Lanka Institute of Nanotechnology Pvt. Ltd. to Paranthan Chemicals Company Limited dated 26th March 2021, Sri Lanka Institute of Nanotechnology Pvt. Ltd herein referred to as SLINTEC, herewith formally accepts the contract mentioned to conduct the consultancy services for the said feasibility study of urea fertilizer manufacturing project in Sri Lanka.

On behalf of SLINTEC, I hereby acknowledge the acceptance of the award along with the mentioned conditions in the reference letter and as per the agreement between Paranthan Chemicals Company Limited and Sri Lanka Institute of Nanotechnology Pvt. Ltd. (SLINTEC) entering on 21st April, 2021, for the total cost of Rs. 35,353.000.00 for the entire feasibility study.

Thanking you,

Sincerely,

**Sri Lanka Institute of Nanotechnology (Pvt) Ltd**
**SLINTEC**
**Mahenwatta, Pitipana, Homagama.**
**Sri Lanka**

Heminda Jayaweera

Chief Operating Officer

[illegible] A.N. Weerasinghe
2022/06/04

රහසිගතයි

# අමාත්‍ය මණ්ඩල කාර්යාලය
# அமைச்சரவை அலுவலகம்
# OFFICE OF THE CABINET OF MINISTERS

**CABINET DECISION** **අමාත්‍ය මණ්ඩල තීරණය** **அமைச்சரவைத் தீர்மானம்**

08 JAN 2021

08 JAN 2021

08 JAN 2021

මගේ අංකය: අමප/20/2043/320/035 2021 ජනවාරි මස 05 දින.

**පිටපත්:**

ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
මුදල් අමාත්‍යාංශයේ ලේකම්.
කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්.
පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.
විගණකාධිපති.

**ක්‍රියා කළ යුතු:**

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.
කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්.
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.

**යූරියා පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට**
**<u>අදාළව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම</u>**

**(කර්මාන්ත ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2020-12-16 දිනැති සංදේශය)**

**2020 දෙසැම්බර් මස 21 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.**

**ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු**
**අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.**

28. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 20/2043/320/035 වූ, "යූරියා පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අදාළව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම" යන මැයෙන් කර්මාන්ත ඇමතිතුමා ඉදිරිපත් කළ 2020-12-16 දිනැති සංදේශය - ඉහත සඳහන් සංදේශය, කර්මාන්ත ඇමතිතුමා විසින් සිදු කරන ලද වැඩිදුර කරුණු පැහැදිලි කිරීම සහ සීමාසහිත ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පෞද්ගලික) ආයතනය (SLINTEC) විසින් යෝජිත ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම වඩාත් යෝග්‍ය වනු ඇති බව සඳහන් කරමින් අමාත්‍ය මණ්ඩලයේ තවත් සාමාජිකයින් කිහිපදෙනෙකු විසින් මෙම රැස්වීමේදී පළ කරන ලද අදහස් සැලකීම් සමග සලකා බලන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව,

(i) ඉහත සඳහන් ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පෞද්ගලික) ආයතනය වෙත පැවරීම; සහ

(ii) ඉහත (i)හි සඳහන් තීරණය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ට නියම කිරීම.

තවද, මෙම තීරණය සම්මත කරනු ලැබූ සේ සැලකීමටත්, ඒ අනුව අවශ්‍ය කටයුතු සඳහා අදාළ බලධාරීන් වෙත මෙම තීරණය දන්වා යැවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ට බලය පැවරීමටත් තීරණය කරන ලදී.

ක්‍රියා කළ යුතු: අධ්‍යාපන අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් යා කොට ඇත.
කර්මාන්ත අමාත්‍යාංශය
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් යා කොට ඇත.

පිටපත්: ජනාධිපති ලේකම් - සංදේශයේ පිටපතක් යා කොට ඇත.
අග්‍රාමාත්‍ය ලේකම් - සංදේශයේ පිටපතක් යා කොට ඇත.
මුදල් අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් යා කොට ඇත.
කෘෂිකර්ම අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් යා කොට ඇත.
පොහොර නිෂ්පාදන හා සැපයුම, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් යා කොට ඇත.